# කොහොඹා කංකාරිය

ශ්‍රී ලංකා ජාතික කලායතනයේ නාට්‍ය අංශයේ කථිකාචාර්ය
**ඇස්. පණීභාරත විසිනි**

"කොහොඹා" යනු අපරට ජනතාව විසින් අති පුරාණයෙහි පටන්, එක් අතකින් සම්පත් ලභාකර දී මෙහිද, අනික් අතින් අපල උපද්‍රව ජනිත කරවීමෙහි ද සමත් කම් ඇති බල සම්පන්න යකෙකු හැටියට ද, දෙවියකු හැටියට ද සලකනු ලබන භූතයෙකි. මොහු පිළිබඳව

යස ඉසුරු සුලභා – සිරි ලකෙහි යුත් ගජබා
මල රජුගෙන් සුබා – වරන් ගත්තේ නමින් කොසඹා

ආරලියෙහි තද වතුර දුවන් නේ
ගෝරුව මඩකර බිජු වපුරන් නේ
සීරුව දන කවිපද පවසන් නේ
රාජවංශ කොසඹා දෙවියන් නේ

යනුවෙන් කොහොඹා හැල්ලේ සහ කොහොඹා දෙවියන්ගේ විත්තිවල සඳහන්වෙ යි. ඔහු සතුටුකිරීම පිණිස පැවැත්වෙන නැටුම් ගැයුම් සහිත උළෙල කොහොඹා කංකාරිය නම් වෙයි.

මෙහි ආරම්භය පිළිබඳ පුරාවෘත්ත කථාව ඉතා රසවත් එකකි. එය මෙසේයි. විජයගෙන් පසු පඬුවස් නුවර පිහිටුවාගෙන ලක් රජයට පත්වූ පඬුවස් දෙව් කුමරාට දිවි දෝෂය නැමැති උවදුරක් පැමිණින. ඒ උවදුර දුරු කිරීම සඳහා ලක්වැසි යක්-දෙස්සෝ දඹදිවින් ආ ඇඳුරන් ද සහාය කරගෙන යාගයක් කළහ. එයින් කුමරා සුවපත් වූවා පමණක් නොව සතුරු උවදුරු නැතිව යාමෙන් රාජ්‍යයද නිස්කණ්ඨක විය.

මෙහි කියන දිවි දෙෂය කුමක් ද යන්න පිළිබඳ මතාන්තර බොහෝ ය. ඒවායින් වැඩිදෙනා පිළිගත් මතය නම් මෙම යාගය මුලින් ම කරණ ලද්දේ උපතිස්ස නුවර පඬුවස් රජුට බවය.

දිනක් පඬුවස් දෙව් කුමරු නිද්‍රෝපගතව සිටියදී දිවියකු සිහිනෙන් දුටුවේ ය. ඒ දිවියා යහන මතවුන් වෙත පැන්නෝ ය. එයින් කුමරා භය විය. ඒ බියෙන් කුමරා බලවත්සේ රෝගාතුර විය. එවකට රටෙහි සිටි දක්ෂ වෙදරදුන් ගෙන්වා ප්‍රතිකාර ලත් නමුත් සුවයක් නොලැබී ය. ඊලඟට ලත් උපදෙස් පරිදි කුමරාට වැළඳී ඇත්තේ යක්ෂ උපද්‍රාවක් යැයි සිතා සෙත් ශාන්ති කිරීම පිණිස හැට පැය මඩුවක එනම් දවසක් මුළුල්ලේ ශාන්ති කර්මයක් කළහ. එයින් කුමරාට වැළඳී තිබුන දිවි දෝෂය හිරුදුටු අඳුර මෙන් දුරීභූත විය. මේ කථාවේ එන හැටියට මෙය කොහොඹා කංකාරියේ පුරාවෘත්තය ය.

මෙතැන් සිට මේ රටේ කෙරීගෙන ආ කොහොඹා කංකාරිය ඒ ඒ යක්දෙව් පරම්පරාවල සිතුම් පැතුම් අනුව අවස්ථාවෙන් අවස්ථාවට වෙනස් වන්නට ඇත.

අද පවත්නා පිළිවෙල මෙසේයි. කොහොඹා යකුන්ගේ අපල උපද්‍රාවන් ගැන විශ්වාස ඇති ගැමියෝ පවුලේ කෙනෙකුට ලෙඩ රෝගයක් වැළඳුන විට තම ගමේ යක්දෙසි ගුරුන්වහන්සේගේ ගෙදරට ගොස් බුලත් දී රෝගය ගැන කියා ඔහුට සුව පිණිස කොහොඹා කංකාරියක් නැටවීමට ආරාධනා කරති. ගුරුන්වහන්සේ නිමිති බලා එයට ශුභ දවසක් නියමකර එයට මුල් අත්තිවාරම වශයෙන් ගුරුන්වහන්සේ කපක් සිටුවයි.

කපට ගන්නේ කොස් ගසක උතුරට ගිය අත්තකින් කපා ගත් කැල්ලකි. එය සාමාන්‍ය ඇත් දතක ප්‍රමාණය ය. සුදු පිරුවට ඇඳ පේවුන ගුරුන්වහන්සේ එම කොස් අතු කැල්ල ගෙන වටා ගොක් කොළ බැඳ සරසා සඳුන් කිරි නහවා අඟුරු දුම්මල අල්ලා පවිත්‍ර කොට එදිනට රුව යක්දෙස්සන්, බෙර වාදකයන්, පැහැදුම් කත්, බත, හත්මාළු, කවි, කෝල්මුර ඇතිව කංකාරිය ඔප්පු දෙනවායි බාරවෙයි.

නියමිත දිනට යක්දෙස්සෝ පිරුවට ඇඳ පේවී මඩුව පේකර අයිල්, තොරන්, යහන් බැඳ වුවමනා සියල්ල සම්පූර්ණකර ගනිති. ගෙහිමියා නැති බැරිකම් ඇති කෙනෙක් නම් ගමේ ප්‍රභූන් කීප දෙනෙකුට කියා අඩුපාඩු පිරිමසා ගනී. ගමේ කොටු කාරයා බුලත් කඩාදෙයි. හේනේ මාමා පිරුවට සපයයි. ගැමියෝ ලබු, පුහුල්, පිපිඤ්ඤා, කැකිරි, තියඹරා ආදිය පළමුව ගෙන එති. නෑදෑයෝ කැවුම්, කෙසෙල් ගෙඩි, කිරිබත්, ආදී කදමළු බැඳගෙන එති. ඒවායින් මඩුවේ වියදම් ද හුඟක් හරියක් පිරිමැසෙයි. එපමණක් නොව කම් මෙත්තන් නොකන් මෙත්තන් සැම සියලු දෙනාටම සෑම යුතුකමක් ඉටුවෙයි. මේවා කෙරෙන්නේ බොහෝ දුරටම යුතුකම් හැටියට ය.

යහන්මල්පැල්වල පහන් තියා හඟල යැදීම කංකාරියේ පූර්ව කොටස ය. ඒවා අවසන්, වීමෙන් පසු බෙර වාදකයෝ බෙර ගසති. අනතුරුව යහන් බෙර සහ අත්‍යබෙර වයති.

චාරිත්‍රානු ගත මේ බෙර වැයුම්වලින් නැට්ටුවෝ ඇඳුම් ඇඳ රඟමඩලට පිවිසෙති. ඔවුහු පළමුවෙන් මෙසේ කෝලපාඩුව අරඹති.

තකුද ගජිජිතකුද ගජිං /// ගජිං ගජිං කුජිං කුජිං ///
තකුඳ කුඳකුඳකුඳ කුඳ කුඳ ගජිං ද්‍රොද් දෙං තා
ජෙහෙකඩ තහකඩ /// තකුදං ජිං ජිං /// තකුතක
ජිං ජිං ///

තකුඳ කුඳකුඳ කුඳ කුඳ කුඳ ගජිං ගජිං ද්‍රොද්
ද්‍රොං තා
ජෙහෙකඩ තහකඩ /// කඩ ජෙහෙකඩ තහකඩ ///
ජිං ගත්තක් තෙහිං ජිජි ගත්තක් තෙහිං ජිං ජිං ගත
කුඳගත තකුදං ජිං ජිං ///
තකුතක ජිං ජිං // තකුඳ කුඳ කුඳ කුඳ කුඳ කුඳ //
ගජිං ගජිං ද්‍රොද් ද්‍රොං තා.

යන තාලයට නැටුම ආරම්භකරති. ඊට පසු අයිලේ සෑදීම නම් වූ ආරාධනා පද කියනු ලැබේ. එයින් කෙරෙන්නේ අළුත් කොහොඹා පරණ කොහොඹා මහා කොහොඹා වලියක් දෙවි, ඉරුගල් බණ්ඩාර, කන්දේ බණ්ඩාර, කළු බණ්ඩාර, වීරමුණ්ඩ, අඹරාපති, මහාගුරු කුඩාගුරු මෙලෙ-යියකු, කඩවර යකු යන මේ දේව සමාගමේ දෙවියන්ට ද යකුන්ට ද මෙතනට පැමිණෙන මෙන් ආරාධනා කිරීම ය.

සතර කෝරළය සත් කෝරළය මහනුවර යන පළාත්වල මෙම කංකාරි ක්‍රමයන් පවතින අතර පළාත් වශයෙන් ඒ ඒ පළාත්වලට අධිගෘහිත දුනමාලේ මොරටු දෙවියෝ ආදි වශයෙන් ද අධිගෘහිත දෙවි වරුන්ට කවි තෝල්මුර ද දක්වනු ලැබේ.

සිර සක් මිහිඳා බෙර ගොස කරසවන සද
මන සක් සතුටු කරවන හිමි මෙරහ ' බැසා
සිය යක් ලෙසින් රැක දෙන හිමි සඳිනි තොසා
වැදි යක් තුන් දෙළස වෙන වෙනම යදිමි සද

බැසවැද්දේන්, සිටවැන්දේන්, එසක්වලින් මෙසක්වලට දසදහසක් සක්වලට යනාදි කවි සහ සැහැලි කියා වැදියක් තුන් දෙළසට ආයවනා කරයි. මෙයද කංකාරියේ තිබෙන චාරිත්‍රයන් ගෙන් විශේෂ තැනක් ගන්නා කොටසකි.

ඊළඟට කෙරෙන්නේ අස්නේ නැටුමයි. මෙහිදී කියවෙන්නේ විජය කුමරු ලංකාවට ගොඩ-බැසීමේ පුවතත්, නෙරපණු ලැබූ කුවේණියගේ විලාපයත්, ආශ්‍රයෙන් ගෙතුණු අස්නේ පද සහ යාදිනි ය.

අස්නේ හමාරකර යාදිනි නටනු ලැබේ. ඉන්පසු යහන් දැකීමය. මෙහිදී බුලත්පදය,කහදිය කොතලය පදය, දුම්මල පදය, යාමුට්ටි පදය, පොල් පදය, සළු පදය හා මල් පදය යන පද හත නටනු ලැබේ,

කුජිං තක් /// කුජිං තත් කුජිං තත් තත් ///
තකුදං ගජිං
කුඳ කුඳ ගත /// කුඳ කුංතක තරිකිට කුඳගත
කුකුඳත්
ජිං ජිං තකුදං ගජිං .........

බුලත් පදයේ සිට මෙසේ පිළිවෙලින් රහපානු ලැබේ.

ඊළඟට එක්තාලේ, හත්තාලේ, නටා අනතුරුව අඩව් නටා ආවැන්දුම නටනු ලැබේ. එයින් පසු රඟමඩලට කැඳවූ දෙවිවරුන්ට කවි කෝල්මුර දක්වා කඩවර හත් කට්ටුවට යාදිනි කියා අලුයම යාමයෙහි කඩවර යක්ෂයන්ට තටුව පුදනු ලැබේ.

කඩවර බත් දෙන සැටි දන ගන්නේ<br>
අඬමොර ගා කුකුලන්බිලි ගන්නේ<br>
දූඩිතර අය අල්ලා මිරි කන්නේ<br>
මේ ලෙස කඩවර යකු දෙළ ගන්නේ

යන ආදි කවි පංතියක් කියා කඩවර යක්ෂයාට තටුව පුදනු ලැබේ.

ඊළඟට පලවැලදනය, දිවිදනය, සුරාහිදනය, ඌරුදනය, වැදි දනය යන දන පහද ඊළඟට විජයරාජ කථාව, කුවේණි කථාව, දඬු මොණර කථාව, පඬුවස් කථාව, සිංහ වල්ලි කථාව යන කථා පහද යාදිනි සහිතව නටනු ලැබේ.

එයින් පසුව දුනු මාලප්පුව නටා දෙවියන්ට අභිවාදනය කර මල නැටීමේ යාදින්න පැවැත්වෙයි. අනතුරුව මල් හත්පදය, නටා පොල් මල යහනේ තබා යාතිකාකොට ආතුරයන්ගේ දෙස් දුරු කෙරෙයි.

ඊළඟට මුද්‍රා ක්‍රමයෙන් ඌරා යක්කම, නයාගේ යක්කම දර්පණී යක්කම, වැදි යක්කම, වනේ යක්කම යන යක්කම් පස නටනු ලැබේ.

අහසින් යොත්නක් උඩ බැඳ ගත්තෙමි<br>
පොළවෙන් යොත්නක් වටකර බැන්දෙමි<br>
වටින් සතර යොත්නක් වට බැන්දෙමි<br>
භූමි නාගයා සත්කොට බැන්දෙමි

එක්කොට බැන් දෙන් ඉරු දෙවියන් අණ<br>
දෙ පො ට ක් බැන්දෙන් සඳ දෙවියන් අණ<br>
තු න් ප ට බැ න් දෙ න් තුන් සරණේ අණ<br>
සි ව් ප ට බැ න් දෙ න් සතරවරම් අණ

යන ආදී කවි කියා යක්කම් පස පිළිවෙළින් නටා වැද්දන් ගිවිස්සවා යක්දෙස්සන් සියලු දෙනාම එක්වී කොහොඹා හැල්ල රහ දක්වා ගෙය, කොල්ලකා මුව මලවිද, ගෙවැසියන්ට දෙළොස් අවුරුද්දකට කිසි අපල උපද්‍රාවක් නොවන සේ ආ වැඩීමෙන් කංකාරිය සමාප්ත කරණු ලැබේ.

මෙම හැටපස් මංගල්‍යය සිංහල නාට්‍යකලාවේ උසස්ම අංගයකි. උඩරට නාට්‍ය කලාවේ ඇති උසස්ම ශාස්ත්‍රීය නැටුම් කොටසත් බෙර වාදන යෙහි උසස්ම පද මාත්‍රාදියත් දේශීය ගායනෙහි වැදගත් සියුම් තාල රාග ආදී කලාවන් එකවර රසවිඳීමට සකස් කර ඇති, මෙම හැටපස් මංගල්‍යය ශාස්ත්‍රීය පදනමක් උඩ සකස් වී ඇති අපූරු නිර්-මානයකි. මෙය හුදු විනෝදයට පමණක් සීමා වී නැත.

එදිනෙද ජීවිතයේ සැප සම්පත් සරුසාර කරගැනීම සඳහා මිනිසා තුළ පුරුද්දක් ඇතිවූයේ දේවත්වය කෙරෙහි ඇති තද විශ්වාසය නිසා ය. ඒ දේව විශ්වාසය අධ්‍යාත්මික පාරිශුඩිය හා මිනිසාගේ සිතුම් පැතුම් චාරිත්‍ර, වාරිත්‍ර සැමෙකක්ම එක මගක් ගත්හ. මොවුන් එකට කාබී නටා ගයා වයා එක්සත්ව එක්සිත්ව එකාමෙන් තම යුතුකම් නොපිරිහෙලා ඉටුකළ උත්සවය කංකාරිය යැයි සිතීමට පුළුවන.

එසේ වුවද එවැනි චාරිත්‍ර රැකීම නළුවන් හා ගැමියන්ගෙන් ක්‍රමයෙන් තුරන්වීගෙන යැම ජාතික පරිහානියැකැයි කනගාටුවෙන් වුවද ප්‍රකාශ කිරීමට සිදුවී ඇත. අද සමාජයේ නොදැකිය හැකි උසස් ගති ගුනාංග එද පුරුදුව සිටි මිනිසා සංස්කෘතික හැඩගැස්මකට නිසර්ගයෙන් පුරුදු පුහුණු ව' සිටියේය.

විද්‍යා කාර්මික, යාන්ත්‍රික ආදී දෙයින් දිනෙන් දින ප්‍රගතිය කරා ගමන් කරන අවදියක එසේ දෙවියන් කෙරෙහි පුද පූජා නැටුම් ගැයුම් දැක්වීමට රුචිකත්වය ඇති අය නොමැතිවීම පුදුමයක්, නොවේ. එහෙත් දෙවියන්ට යකුන්ට ආදී එවකට සිටි අධිපතීන්ට පැවැත්වූ නැටුම් ක්‍රම අදට වුවමනා අන්දමට සකස් කොට කරලියට ගෙන ඒම ඉතාමත් කාලෝචිත ය. එහිදී අපේ ක්‍රමවලට හානියක් නොවන පරිද්දෙන් ඒ දේවල් සකස් කර ගැනීම තමා සතු කාර්‍ය්‍යයකි. නො එසේ නම් දිවි දෙවෙනි කොට මේ කලාවන් ආරක්ෂා කරගෙන ආ කලා ඇදුරන් කීපදෙනෙකුගේ, නොමසුරු උත්සාහය නිසා රැකුණු මෙම කලාව නොකෙලෙසා රැකගැනීම අපගේ පරම යුතුකමකි.